# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/50 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

පළමුවන උපලේඛනයේ 10(1)(ආ)(ii) ඡේදය යටතේ නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 194 වගන්තිය සමග කියවිය යුතු පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ (1) උපඡේදයේ (ආ) අයිතමයේ (ii) වන උපඅයිතමය යටතේ මූල්‍යායතනවල තැන්පත් කර ඇති මුදල් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියකුට ගෙවනු ලබන පොළියෙන් ආදායම් බදු අඩුකිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය ඇමතිවරයා විසින් කරනු ලබන නියෝග. මෙම නියෝග 2018 අප්‍රේල් 01 වන දා සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

(අ) උපලේඛනයේ I වන කොටස යටතේ අනුප්‍රමාණ අදාළ කරගත යුතු ය ;

(ආ) උපලේඛනයේ II වන කොටස යටතේ යම් මූල්‍යායතනයක තැන්පත් කර ඇති මුදල් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියකුට පොළී මුදලක් ගෙවනු ලබන අවස්ථාවක එම පොළියෙන් බදු රඳවාගත යුතු වන ආකාරය නියෝග කර ඇත.

*උපලේඛනය*

*I වන කොටස*

| *රඳවාගැනීමේ බද්දට යටත් වන පොළී ආදායම* | *රඳවාගැනීමේ බදු අනුප්‍රමාණ* |
|---|---|
| ජ්‍යෙෂ්ඨ පුරවැසියකු තක්සේරු වර්ෂයක් සඳහා සියලු මූල්‍යායතන වලින් ව්‍යුත්පන්න වන්නාවූ ඔහුගේ/ඇයගේ මුළු පොළී ආදායම රු. 1,500,000 ක් ඉක්මවන | 5% |



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

බව ඔහුගේ/ඇයගේ ප්‍රකාශයක් මත, අතිරික්ත පොළී ආදායම සඳහා

*II වන කොටස*

- **ප්‍රකාශනය**

- ජ්‍යෙෂ්ඨ පුරවැසියා විසින් මූල්‍යායතනයක පවත්වාගෙන යන එක් එක් බැංකු ගිණුම සඳහා පහත දක්වා ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ප්‍රකාශනයක් එක් එක් තක්සේරු වර්ෂයේදී ලබා දිය යුතු ය.

- **අසත්‍ය හෝ නොමග යවනසුලු ප්‍රකාශ**
  ජ්‍යෙෂ්ඨ පුරවැසියකු විසින් මූල්‍යායතනයකට සපයන ලද ප්‍රකාශනයක්, නිවේදනයක හෝ සහතිකයක්, පනතේ 181 වන වගන්තියේ පරමාර්ථ සඳහා බදු නිලධාරියකුට කරන ලද නිවේදනයක් සේ සැළකේ.

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

........................................................

........................................................

........................................................

........................................................ වෙතටයි.
(මූල්‍යායතනයේ නම හා ලිපිනය)

ගිණුම් අංකය : .............................................

තක්සේරු වර්ෂය : ........................................

**ප්‍රකාශනය (ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් කරනු ලබන)**

.............................................................................................................................................................. (සම්පූර්ණ නම)
වන මම ........................................................................................................................................ (ලිපිනය) හි පදිංචි මෙයින් ප්‍රකාශ කර සිටිමි ;

මම ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්මි. (2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව)

1. ඉහත තක්සේරු වර්ෂය සඳහා මෙම ගිණුමේ හෝ මෙම බැංකුවේ යම් වෙන යම් ගිණුමක හෝ යම් වෙනත් බැංකුවක යම් වෙනත් ගිණුම්වල හෝ යම් වෙනත් මූල්‍යායතනයක තැන්පත් කර ඇති මුදල් සඳහා මා විසින් ලබන පොළී එකතුව රු. 1,500,000/- නොඉක්මවන්නේ ය. එබැවින්, මෙම ගිණුමට ගෙවිය යුතු පොළියෙන් රඳවාගැනීමේ බදු අඩුකිරීමෙන් වළකින මෙන් කාරුණිකව ඉල්ලමි.

2. මෙම බැංකුවේ යම් වෙනත් ගිණුමකින් හා වෙනත් යම් බැංකුවක යම් වෙනත් ගිණුමකින් හෝ යම් වෙනත් මූල්‍ය ආයතනයකින් ඉහත ගිණුම් සමග මා විසින් ලබාගන්නා පොළියේ එකතුව ඉහත තක්සේරු වර්ෂය සඳහා රු. 1,500,000/-ක මුළු පොළියක් ඉක්මවිය හැක. එබැවින්, කරුණාකර පොළිය රු. .................................... ක් ඉක්මවන අතිරික්තය මත රඳවාගැනීමේ බදු අඩු කරන්න.

3. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඇති රු. 1,500,000/- ක පොළී ආදායම් බදු සහනය මෙම බැංකුවේ වෙනත් යම් ගිණුම්වල හෝ වෙනත් බැංකු හෝ වෙනත් මූල්‍යායතන තැන්පතු මුදල් මත මා විසින් ලබාගන්නා පොළී ආදායම මත මා විසින් ලබාගෙන ඇත. එබැවින්, මෙම ගිණුමෙන් මා ලබාගන්නා මුළු පොළිය සඳහා කරුණාකර රඳවාගැනීමේ බදු අඩුකරන්න.

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ........................................................
ඉහතින් සඳහන් කළ ප්‍රකාශය සත්‍ය හා නිවැරදි බවට මම සහතික වෙමි.

මා පදිංචි ස්ථානයේ යම් වෙනසක් වුවහොත් ඒ අවස්ථාවේදී ඒ බව බැංකුව වෙත දන්වා සිටිමි.

| | |
|---|---|
| .................................................. | .................................................. |
| දිනය | ප්‍රකාශකගේ අත්සන |

(* කරුණාකර අදාළ නොවන වාක්‍ය කපාදමන්න)

04 - 836

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.